# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2023 අංක 31 දරන ගලහ හඳවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය පනත

---

**[සහතිකය සටහන් කළේ 2023 නොවැම්බර් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2023 නොවැම්බර් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 24.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2023 අංක 31 දරන ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය පනත

[සහතිකය සටහන් කළේ 2023 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී.— ඕ. 26/2016

**ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

පූර්විකාව

රෝගී හා අසරණ භික්ෂූන් වහන්සේලා සඳහා භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයක් පිහිටුවා පවත්වාගෙන යාමේ කාර්යය සඳහා "ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන භාරයක්, 2003 පෙබරවාරි මස 7 වන දින පොදු භාරයක් මගින් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී භාරය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බවත්, එම නිසා එකී ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයේ නිසි පරිපාලනයක් නොමැති වීම සහ එම මධ්‍යස්ථානය නිසි පරිදි ක්‍රියාත්මක වීම සඳහා විධිමත් සහ ප්‍රමාණවත් මූල්‍යාධාර ක්‍රමයක් නොමැති වීම ඇතුළු විවිධ හේතු නිසා එකී ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම කළ නොහැකි බව දැන් පෙනී යන හෙයින් ද:

රෝගී හා අසරණ භික්ෂූන් වහන්සේලාගේ යහපත සඳහා එකී ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයේ පරමාර්ථ ඉටුකර ගැනීමට සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස නීති පැනවීම අවශ්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2023 අංක 31 දරන ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය පිහිටුවීම

2. (1) (මෙහි මින්මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) භාරය, (1) වන උපවගන්තිය මගින් එයට පවරනු ලබන නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද, එයට එරෙහිව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, එය භාවිත කිරීමට ද, ස්වකීය කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද, භාරයට සම්පූර්ණ බලය සහ අධිකාරය තිබිය යුතු ය.

භාරයේ පරමාර්ථ

3. (මෙහි මින්මතු "භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගලහ හදුවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයේ සිටින රෝගී හා අසරණ භික්ෂූන් වහන්සේලාට නවාතැන් පහසුකම් සැපයීම සහ ඔවුන් රැකබලා ගැනීම භාරයේ පරමාර්ථය වන්නේ ය.

භාරයේ කර්තව්‍ය

4. භාරයේ කර්තව්‍ය වන්නේ-

(අ) 8 වන වගන්තිය මගින් නියම කරනු ලබන කොන්දේසි හා නිර්ණායක මත රෝගී හා අසරණ භික්ෂූන් වහන්සේලා සඳහා භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සහ රෝගී හා අසරණ භික්ෂූන් වහන්සේලා සඳහා භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයේ නවාතැන් පහසුකම් සැලසීම;

(ආ) භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයේ නේවාසිකව සිටින රෝගී භික්ෂූන් වහන්සේලාගේ එදිනෙදා අවශ්‍යතා ඇතුළු සියලුම අවශ්‍යතා සපුරාලීම සහ ඖෂධ හා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම;

(ඇ) භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයේ නේවාසිකව සිටින භික්ෂූන් වහන්සේලාගේ මානසික සෞඛ්‍යය වර්ධනය කිරීමේ අරමුණින් ඔවුන් වෙනුවෙන් භාවනා වැඩසටහන් සහ වෙනත් බෞද්ධ වැඩසටහන් සංවිධානය කොට පැවැත්වීම; සහ

(ඈ) එහි නේවාසික භික්ෂූන් වහන්සේලාගේ බෞද්ධාගමික දැනුම වර්ධනය කිරීම සහ අලුත් කිරීමට බෞද්ධ පුස්තකාලයක් පවත්වාගෙන යාම.

භාරයේ කළමනාකරණ මණ්ඩලය

5. (1) භාරයේ පරිපාලනය, කළමනාකරණය සහ එහි කටයුතු පාලනය, (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය-

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:–

(i) සෞඛ්‍යය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(ii) බුද්ධ ශාසන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iii) සමාජ සේවා විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iv) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(v) බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(vi) මහා භාරකාරවරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(vii) මහනුවර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්;

(viii) මධ්‍යම පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ;

(xi) දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්; සහ

(x) ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ හෝ ඔහුගේ නියෝජිතයකු; සහ

(ආ) (මෙහි මින්මතු ''පත් කළ සාමාජිකයන්'' යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(i) අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, පරිපාලනය හා ගණකාධිකරණය පිළිබඳ දැනුම හා පළපුරුද්ද ඇති සාමාජිකයින් දෙදෙනකු;

(ii) මල්වතු, අස්ගිරි, අමරපුර සහ රාමඤ්ඤ යන නිකායන් නියෝජනය කිරීම සඳහා එම නිකායන්හි මහානායක ස්වාමීන් වහන්සේලා විසින් නම් කරනු ලබන, ඔවුන් අතරින් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු භික්ෂූන් වහන්සේලා සිව්දෙනකු;සහ

(iii) ගලහ හඳුවතී විහාරස්ථානයේ දායක සභාවේ සභාපතිවරයා.

(3) තම නිල තත්ත්වයෙන් මණ්ඩලයේ සාමාජිකයකු බවට පත් වූ යම් තැනැත්තකු විසින්, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ යම් ධුරයක් ප්‍රකාරව ද ඔහු එම ධුරය දරන තාක් දුරට ධුර දරනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු, ඉල්ලා අස්වීම, මිය යාම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් ධුරයේ පුරප්පාඩුවක් ඇති වුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු ය. ධුරයෙන් ඉවත් කිරීමක දී හැර වෙනත් ආකාරයකින් ධුර කාලය අවසන් වීමට නියමිත යම් සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුසසකු වන්නේ ය. එම නැවත පත් කිරීම, අනුගාමී වුව ද, නොවූව ද, තවත් එක් කාල සීමාවකට වඩා නොවැඩි විය යුතු ය.

(5) යම් පත් කළ සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් ධුරය පුරප්පාඩු වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට යටත්ව, එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එම තැනැත්තා, තමා අනුප්‍රාප්ත වනුයේ යම් සාමාජිකයකුගේ ධුරයක් සඳහා ද, එම සාමාජිකයාගේ ධුර කාලයේ නොගෙවී ඉතිරිව ඇති ධුර කාලය සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(6) රෝගාතුර වීම, ශාරීරික දුබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා මාස තුනකට නොඅඩු කාලසීමාවක් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තම කාර්ය

හා කර්තව්‍ය තාවකාලිකව ඉටු කිරීමට අපොහොසත් වන යම් පත් කළ සාමාජිකයකු විසින්, ඒ බව අමාත්‍යවරයාට ලිඛිතව දැනුම් දිය යුතු ය. එවැනි අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකම්

6. යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එසේ පත් වන්නේ නම්;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට අනාවරණය කරගෙන හෝ ප්‍රකාශයට පත් කර ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු බවට ප්‍රකාශ කර ඇත්නම් සහ එම බුන්වත්භාවයෙන් හෝ බංකොලොත්භාවයෙන් නිදහස් කර නොමැති නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත්ව සිටින හෝ එවැනි දණ්ඩන නියෝගයක් ලැබ ඇත්නම්,

එම තැනැත්තා, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් නොකඩවා කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු වන්නේ ය.

මණ්ඩලයේ බලතල

7. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට පහත බලතල තිබිය යුතු ය:–

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් චංචල සහ නිශ්චල යන දෙයාකාරයෙන්ම, මුදලින් හෝ අන්‍යාකාරයකින් ප්‍රදාන, ත්‍යාග සහ පරිත්‍යාග ලබා ගැනීම සඳහා:

එසේ වුව ද, භාරය වෙත සිදු කරනු ලබන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන්

මණ්ඩලය විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ආ) මේ පනත මගින් හෝ මිල දී ගැනීමක්, ත්‍යාගයක්, ප්‍රදානයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් භාරය සතුවන යම් නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීම හෝ දූරීම සහ භාරයට හිමිකම් ලැබෙන යම් දේපළක්, මේ පනතේ කාර්යය සඳහා විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානය කිරීම, පැවරීම, බෙදීම, අන්සතු කිරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම සඳහා;

(ඇ) භාරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම්වලට ඇතුළත් වීම සහ ඍජුවම හෝ මණ්ඩලයේ නිලධරයන්, සේවානියුක්තයන් සහ මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා බලය පවරන ලද නියෝජිතයන් හරහා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා; සහ

(ඈ) මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබිය හැකි පරිදි වූ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වසා දැමීම සඳහා.

*භික්ෂූන් වහන්සේලාගේ නවාතැන් ආදිය*

8. භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයේ භික්ෂූන් වහන්සේලාට නවාතැන් ලබා දීම සඳහා සහ එකී භික්ෂූන් වහන්සේලා රැකබලා ගැනීම සඳහා වන කොන්දේසි සහ නිර්ණායක නියෝග මගින් නියම කරනු ලබන ආකාරයෙන් විය යුතු ය.

*දේපළ දැරීම සඳහා භාරයට ඇති බලය*

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් භාරය සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළ භාර ගැනීමට හා දැරීමට භාරයට නීතියෙන් හැකියාව ඇති අතර, එම සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා භාරය විසින් දරනු ලැබිය යුතු ය.

*මණ්ඩලයේ රැස්වීම්*

10. (1) මණ්ඩලයේ රැස්වීම් අවම වශයෙන් මාස තුනකට වරක්වත් පවත්වනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය දරනු ලැබිය යුතු ය. මණ්ඩලයේ යම්

රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක, එම රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයන් විසින් එම රැස්වීමේ මූලාසනය දැරීම සඳහා ඔවුන් අතරින් සාමාජිකයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් එකොළොස් දෙනකු විය යුතු ය.

(4) යම් රැස්වීමක දී ඡන්ද සමානව ඇතිවිට, සභාපතිවරයාට හෝ එම රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මණ්ඩලය විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව, එහි රැස්වීම්වල දී සහ එහි කටයුතු කරගෙන යෑමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය නියාමනය කරනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලයේ සාමාජිකයින් අතර පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මත පමණක් මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ කාර්ය පටිපාටියක් අවලංගු වන ලෙස නොසැලකිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණීම සඳහා වන පාරිශ්‍රමිකය

11. මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණීම වෙනුවෙන් එහි සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

උපදේශක කමිටුව

12. භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයට අදාළ කාරණා සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දීම සඳහා මල්වතු, අස්ගිරි, අමරපුර සහ රාමඤ්ඤ යන නිකායන්හි මහානායක ස්වාමීන් වහන්සේලාගෙන් සමන්විත උපදේශක කමිටුවක් පැවතිය යුතු ය.

ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාර අරමුදල පිහිටුවීම

13. (1) (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන) ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාර අරමුදල ලෙස හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. අරමුදලේ කළමනාකරණය, පරිපාලනය, පාලනය සහ ක්‍රියාත්මක කිරීම මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු ය.

(2) පහත දැක්වෙන මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය:-

(අ) අරමුදලේ පරමාර්ථ ඉටු කරගෙන යාමේ කාර්යය සඳහා, කලින් කලට, පාර්ලිමේන්තුව විසින් වෙන් කර දී ඇති සියලු මුදල් ප්‍රමාණ;

(ආ) 7 (අ) වන වගන්තියට යටත්ව, අරමුදලේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ විදේශයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ලැබෙන යම් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග.

(3) මේ පනත යටතේ, භාරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීමේ දී එය විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

භාරයේ කාර්ය මණ්ඩලය පත් කිරීම

**14.** (1) භාරය විසින්, එහි කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි එය විසින් සලකනු ලැබිය හැකි නිලධරයන් සහ සේවානියුක්තයන් යම් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

(2) භාරය විසින්, (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන නිලධරයන් සහ සේවානියුක්තයන් සම්බන්ධයෙන්-

(අ) එම නිලධරයන් සහ සේවානියුක්තයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ ඔවුන් සේවයෙන් ඉවත් කිරීම;

(ආ) එම නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීම; සහ

(ඇ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික එම නිලධරයන්ට සහ සේවා නියුක්තයන්ට ගෙවීම,

කරනු ලැබිය හැකි ය.

රජයේ නිලධරයන් පත් කිරීම

**15.** (1) මණ්ඩලයේ ඉල්ලීම මත, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් කාලසීමාවක්

සඳහා භාරයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු භාරයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කර ඇති අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කරගනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු භාරයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කර ඇති අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කරගනු ලැබිය යුතු ය.

**16.** (1) භාරයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

(2) මණ්ඩලය විසින් භාරයේ ආදායම් සහ වියදම් පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවන්හි ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන භාරයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

**17.** (1) මණ්ඩලය විසින්, එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස හයක කාලයක් ඇතුළත එම වර්ෂය සඳහා භාරයේ විගණනය කරන ලද ගිණුම් සමග භාරය විසින් කරගෙන යන ලද කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය. වාර්ෂික වාර්තාව

(2) අමාත්‍යවරයා විසින්, වාර්ෂික වාර්තාව ලැබුණ දින සිට මාස තුනක් ඇතුළත (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන සමග එම වාර්තාව පාර්ලිමේන්තුවේ දී සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ මුද්‍රාව

**18.** (1) මණ්ඩලයේ මුද්‍රාව-

(අ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, එය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ආ) මණ්ඩලය විසින්, කලින් කල, තීරණය කරනු ලැබිය හැකි තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය;

(ඇ) මණ්ඩලයේ අනුමතය නොමැතිව සහ තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් සභාපතිවරයා සහ මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු ඉදිරිපිට දී අත්සන් තබනු ලබන සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හැර වෙනත් කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, එහි මුද්‍රාව තබනු ලබන සාධන පත්‍රවල සහ ලේඛනවල රෙජිස්ටරයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී දරන ලද වියදම් අයකර ගැනීම

**19.** (1) යම් අධිකරණයක, භාරය විසින් හෝ එයට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී භාරය විසින් දරන ලද යම් වියදමක් එහි අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, භාරය විසින් එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අය කරගනු ලබන සියලු මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පරිදි, මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ භාරයේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ එම තැනැත්තාට එරෙහිව ගෙන එන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී එම තැනැත්තා විසින් ඒ සම්බන්ධයෙන් දරන ලද යම් වියදමක් එම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඔහු විසින් අයකර ගනු ලැබුවේ නම් මිස, එම ක්‍රියාව ඔහු විසින් සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය පිළිගතහොත්, එම මුදල අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

නියෝග

**20.** (1) අමාත්‍යවරයා විසින් මල්වතු, අස්ගිරි, අමරපුර සහ රාමඤ්ඤ යන නිකායන්හි මහානායක ස්වාමීන් වහන්සේලා විමසා, මේ පනත නියම කරනු ලැබිය යුතු යයි නියම කර ඇති හෝ නියෝග සෑදීමට බලය දී ඇති යම් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින සිට හෝ එම නියෝගවල නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ අනුමත කරනු නොලැබුවේ යම් දිනයක ද එම දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**21.** (1) මණ්ඩලය විසින්, මේ පනත මගින් රීති සෑදීමට බලය ලබා දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය. රීති

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව පහත සඳහන් යම් කාරණයක් හෝ සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:-

(අ) භාරයේ පරිපාලනය සහ කළමනාකරණය;

(ආ) එහි රැස්වීම් පැවැත්වීම හා ඒ හා සම්බන්ධ කාරණා;

(ඇ) භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානයේ භික්ෂූන් වහන්සේලාට නවාතැන් ලබා දීමට සහ භික්ෂූන් වහන්සේලා රැකබලා ගැනීමට අදාළ කොන්දේසි සහ නිර්ණායක උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම; සහ

(ඈ) භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරනු ලබන සහ පවත්වනු ලබන වැඩසටහන්.

දණ්ඩ නීති සංග්‍රහය යටතේ භාරයේ නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**22.** (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා භාරයේ සියලු නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව භාරය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

**23.** භාරය, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**24.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"භික්ෂු" යන්නට, (318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"අමාත්‍යවරයා" යන්නෙන්, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පවරන ලද අමාත්‍යවරයා අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**25.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.